# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 23 දරන
# වෛද්‍ය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 ජූනි මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 ජූනි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල: ශත 60 යි　　　　තැපැල් ගාස්තුව: ශත 60 යි

1985 අංක 23 දරන වෛද්‍ය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 ජූනි මස 21 වන දින.]

එල්.ඩී.—ඕ. 47/82

**වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**කෙටි නාමය හා ක්‍රියාත්මක වන දිනය.**

1. මේ පනත 1985 අංක 23 දරන වෛද්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

**105 වන අධිකාරයේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෛද්‍ය ආඥාපනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඇ) ඡේදය වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඇ) ඖෂධවේදීන් වශයෙන් කාර්යක්ෂමතාව පිළිබඳ සහතික හෝ ප්‍රවීණතාව පිළිබඳ සහතික ; සහ".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත්කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) යම් තැනැත්තෙක් යහපත් චරිතයකින් යුක්ත වේ නම්, සහ —

(අ) හයවන උපලේඛනයේ ඇතුළත් විධිවිධානවලට අනුකූලව අවුරුදු දෙකක ආධුනිකත්ව කාලසීමාවක් සේවය කර ඉතික්බිති ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක හෝ ඊට පෙර විද්‍යාලයීය සභාව විසින් නිකුත් කරනු ලබන ඖෂධවේදී කාර්යක්ෂමතා සහතිකයක් ලබා ගත්තේ නම් ; හෝ

(ආ) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ඖෂධවේදීන් සඳහා වූ අභ්‍යාස පාඨමාලාව හදාරා, විද්‍යාලයීය සභාව විසින් නිකුත් කරනු ලබන ඖෂධ වේදී ප්‍රවීණතා සහතිකයක් ලබා ගත්තේ නම් ; හෝ

(ඇ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් විශ්වවිද්‍යාලයක් විසින් ප්‍රදානය කරනු ලබන ඖෂධවේදය පිළිබඳ උපාධියක් හෝ ඩිප්ලෝමාවක් දරන්නේ නම් ; හෝ

(ඈ) ඇපොතිකරිවරයෙක් වේ නම් ; හෝ

(ඉ) චතු ඇපොතිකරිවරයෙක් වේ නම්

මිස, ඔහු ඖෂධවේදියකු වශයෙන් ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

ඒ 083811—6,750 (85/05)